# THE WESTMINISTER MODEL IN SRI LANKA AND ITS CHANGES (Part II)

# ව්‍යවස්ථාදායකයේ සංයුතිය සහ ස්වාධිපත්‍යය

සෝල්බරි ක්‍රමය යටතේ පාර්ලිමේන්තුව සකස් වූයේ ආයතන 3 ක එකතුවෙනි.

1. රැජින (අග්‍රාණ්ඩුකාරයා)
2. නියෝජිත මන්ත්‍රී මණ්ඩලය
3. සෙනෙට් සභාව

පාර්ලිමේන්තුවේ ප්‍රධාන ආයතනය වූයේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය යි. මෙම මණ්ඩලය සමන්විත විය යුතු සාමාජික සංඛ්‍යාව ව්‍යවස්ථාවේ දක්වා තිබුණේ නැත. සෑම ජන සංගණනයකටම පසුව ඡන්ද කොට්ඨාස සීමා නිර්ණය කොමිසන් සභාව විසින් ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම මගින් සංඛ්‍යාව තීරණය කළ යුතු යැයි ව්‍යවස්ථාවේ සඳහන් විය. සෝල්බරි ව්‍යවස්ථාව ක්‍රියාත්මක වූ කාලය තුළ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව එක ම ආකාරයෙන් පැවතුණේ නැත.

ClassWork LK

1947-1959 කාලය තෙක් මන්ත්‍රී සංඛ්‍යාව 101 ක් විය. මින් 95 දෙනෙකු ඡන්ද කොට්ඨාස පදනමින් ජනතා සෘජු ඡන්දයෙන් ද ඉතිරි 6 දෙනා සුළු ජන කොටස් නියෝජනය කිරීම සඳහා ද පත් කරන ලදි.

1960 සෝල්බරි ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වූ ඉතිරි කාලය තුළ මන්ත්‍රී සංඛ්‍යාව 157 ක් විය. ඉන් 151 ක් ඡන්ද කොට්ඨාස පදනමින් ජනතාවගේ සෘජු ඡන්දයෙන් තේරී පත් වූ අතර ඉතිරි 6 දෙනා සුළු ජන කොටස් නියෝජනය කිරීමට පත් වූහ.

දෙවන මණ්ඩලය වූ සෙනෙට් සභාව තිස් දෙනෙකුගෙන් සමන්විත විය. මින් 15 දෙනෙකු අගමැතිගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකාරයා විසින් පත් කරන ලද අතර ඉතිරි 15 දෙනා පාර්ලිමේන්තුවේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය තුළ නියෝජනය වූ දේශපාලන පක්ෂ විසින් තෝරා පත් කර ගන්නා ලදි.

Class Work LK

අප පෙර ද දුටු පරිදි, ජාතික රාජ්‍ය සභාව සමන්විත විය යුතු සාමාජික සංඛ්‍යාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නිශ්චිත ලෙස සඳහන් කොට නොතිබිණි. එය නිර්ණය කරන ලද්දේ ව්‍යවස්ථාවේ 77 වගන්තිය යටතේ සීමා නිර්ණය කිරීමේ කොමිසම විසිනි.

සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවට පරම ව්‍යවස්ථාදායක බලයක් හිමි නොවී ය. එනම්,

- 29(2) වන වගන්තිය සංශෝධනය කිරීමට හෝ අහෝසි කිරීමට හෝ බලය පාර්ලිමේන්තුවට නොතිබිණි.

- යම් පනතක් ව්‍යවස්ථාවට අනුකූල නොවේ නම් ඒ නීති බල රහිත කිරීමේ බලය අප්‍රකාශිත ව අධිකරණයට තිබීම. (ශ්‍රේෂ්ඨාධිකරණය)

- 1947 ලංකා ස්වාධීනතා පනත අනුව ලංකාවේ ඉල්ලීම හා කැමැත්ත මත ලංකාව වෙනුවෙන් නීති පැනවීමේ බලය බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව සතු වීම.

ClassWork.LK

- 1972 ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාව නීති සම්පාදනය කිරීමේ බලතල සහිත එක ම ආයතනය විය. එනම්,

- ව්‍යවස්ථාවේ පස් වන වගන්තියට අනුව ශ්‍රී ලංකා සමූහාණ්ඩුවේ රාජ්‍ය බලය ක්‍රියාවට නංවනු ලබන උත්තරීතර උපකරණය වූයේ ජාතික රාජ්‍ය සභාව යි.

- 44 වන වගන්තියට අනුව ජාතික රාජ්‍ය සභාවේ ව්‍යවස්ථාදායක බලතල උත්තරීතර විය.

- ජාතික රාජ්‍ය සභාවේ ව්‍යවස්ථාදායක බලයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ ව්‍යවස්ථාවෙන් කොටසක් හෝ පරිච්ඡින්න කිරීමේ බලය ද, සංශෝධනය කිරීමේ බලය ද නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැනවීමේ බලය ද ඇතුළත් විය.

ClassWork.LK

- 45 වන වගන්තියට අනුව ජාතික රාජ්‍ය සභාවට හිමි වන ව්‍යවස්ථාදායක බලය අත්හැරීමට, පැවරීමට හෝ කිසි ම ආකාරයකින් අන් සතු කිරීමට හැකි යාවක් නොතිබිණි.

- 39 වන වගන්තියට අනුව රාජ්‍ය සභාව විසින් පනවන ලද කිසිම නීතියක වලංගු භාවය ප්‍රශ්න කිරීමට හෝ ඒ පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට හෝ අධිකරණයට හෝ වෙනත් ආයතනයකට හෝ බලය හිමි නොවී ය.

මේ කරුණු අනුව සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පැවති ව්‍යවස්ථාදායකය මෙන් නොව, 1972 ව්‍යවස්ථාදායකය පූර්ණ ස්වාධිපත්‍ය බලය සහිත ආයතනයක් විය.

ClassWork.LK

ClassWork.LK